**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේ දී ගිවිසුම් වලට එළඹ නොතිබුණු එකතුව රු.2,000,000 ක සංවර්ධන ව්‍යාපෘති 04 ක් ණය හිමියන් යටතේ දෝෂ සහගතව දක්වා තිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් විනාශ කළ රු. 71,461 ක ආයුර්වේද තොගයක් හා රු. 6,980ක් වටිනා පොදු ගබඩා තොගයක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ජ'නල් අංක 39 හා 41 යටතේ ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ වියදම රු.78,441 ක් වැඩියෙන් දැක්විණි. | ඉකුත් වර්ෂයේ ඉවත් කළ භාණ්ඩ ගලපා ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂාය් අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 ක ශේෂයන් උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු.750,541 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 ජනවාරි 01 දිනට පැවති එකතුව රු. 1,017,525 ක ලිබඩු හා සවිකිරීම්වල භෞතික පැවැත්ම හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | වෙනස සොයා බලා කටයුතු කරන බව. | වත්කම්වල පැවැත්ම තහවුරු කර ගත යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත 22 (1) වගන්තිය | ඉඩම් අනුබෙදීමකට අදහස් කරන ඉඩමේ භූමි ප්‍රමාණයේ විශාලත්වයෙන් සියයට 10 කට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථාන වලින් වෙන් කරගත යුතු වුවත් සභාවට වෙන්වුණු පර්චස් 935 ක භූමියෙන් පර්චර් 422.4 ක් පමණ කළුගල් සහිත භූමි හා බෑවුම් සහිත පොදු කටයුතු සඳහා නුසුදුසු භූමි ප්‍රමාණයක් ලබාගෙන තිබුණු අතර අදාළ ඉඩම් කොටස් පොදු කටයුතු හෝ ඵලදායී කටයුත්තකට හෝ යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පොදු කටයුතු සිදු කර නොමැති බව | අදාළ ඉඩම් අරමුණුගත කාර්යයකට යොදවා ගත යුතුය. |

**(ආ)** අතුරු ව්‍යවස්ථා

| | | | |
|---|---|---|---|
| 2022 නොවැම්බර් 18 දිනැතිව 2307 අංක දරන ගැසට් පත්‍රයේ පළකල ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | සභා බල ප්‍රදේශයේ පිහිටි ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන වලින් 2015 සිට 2022 දක්වා රු.5,348,350 ක් අයවිය යුතු ත්‍රීරෝද රථ ගාස්තු අයකර ගෙන නොතිබුණි | ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇති බව | අතුරු ව්‍යවස්ථා විධිවිධාන පරිදි ගාස්තු අය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | 2012 සිට 2021 කාලයට අදාළ කාලය ඉකුත් වූ රු. 3,555,969 ක පොදු තැන්පතු ශේෂ 82 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | සභාව සතු වාහන 11 ක 2019 – 2021 වර්ෂවලට පසු ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | ඉදිරිවර්ෂයේ සිදුකරන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු51,610,991 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.43,900,990 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රුස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රුස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රුස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රුස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,158,720 | 3,214,764 | 3,940,584 | 4,018,045 | 3,151,936 | 3,359,800 | 5,889,272 | 4,743,865 |
| (ii) | කුලී | 7,750,000 | 7,564,223 | 7,700,410 | 1,309,705 | 2,475,925 | 6,674,473 | 6,625,282 | 1,445,891 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,501,365 | 4,459,415 | 5,065,965 | 5,348,350 | 2,203,765 | 2,400,556 | 1,762,856 | 5,554,900 |
| (iv) | වෙනත් ආදායම් | 148,841,018 | 144,974,143 | 94,577,722 | 140,030,873 | 51,043,879 | 51,923,098 | 58,256,724 | 89,634,452 |
| | එකතුව | 163,251,103 | 160,212,545 | 111,284,681 | 150,706,973 | 58,875,505 | 64,357,927 | 72,534,134 | 101,379,108 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කායර්සාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.3,376,325 ක් වූ අතර, ඒකකයක වරිපනම් හිඟය රු.10,000 ඉක්මවූ දේපල 55 කින් එකතුව රු.1,717,669 ක් අයකරගෙන නොතිබුණි. | දේපල තහනම මඟින් අය කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර ආදායම් අය කළ යුතුය. |
| (ii) | සභා බල ප්‍රදේශය තුළ පවතින රාජ්‍ය ආයතන 06 ක පැවති දේපළ 34 ක් සඳහා වසර 01 ත් 18 ක් අතර කාලයක සිට පවතින රු.676,604 ක් අයකරගෙන නොතිබුණි. | රාජ්‍ය ආයතන දැනුවත් කර ඇති බව. | වරිපනම් බදු අයකළ යුතුය. |
| (iii) | 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, 2009 වර්ෂයෙන් පසු නව තක්සේරුවක් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පාර්ශව දැනුවත් කර ඇති බව. | නව තක්සේරුවක් ලබාගෙන අයකළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.641,721 ක අක්කර බදු ශේෂය අයකර නොතිබුණි. | දැනුවත් කිරීම් සිදු කර ඇති බව. | බදු අයකරගත යුතුය. |
| (ආ) | **කඩ කුලී** | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ කඩ කුලී රු. 1,309,705 ක් පැවති අතර 2019 වර්ෂයේ සිට ගලහා පොදු වෙළඳපල කුකුල්මස් කඩ කාමරය සඳහා රු.191,520 ක් හා 2020 වර්ෂයේ සිට දෙල්තොට මාළු කඩය සඳහා රු. 155,833 ක් අයවීමට පැවතුණි. එමෙන්ම දීර්සකාලීන ටෙන්ඩර් කර ලබාදුන් කඩකාමර 03 කින් 2013- 2021 කාලයට අදාළව හිඟ කඩ කුලී රු.414,710 ක් විය. | මේ වන විට අයවෙමින් පවතින බව. | ආදායම් අයකළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.18,550,388 ක් වූ අතර, එක පාරිභෝගිකයකුගේ රු.10,000 ඉක්මවූ ජල පාරිභෝගිකයින් 824 දෙනෙකුගෙන් රු. 6,000,311 ක් විය. | ජංගම සේවා පවත්වා අයකරන බව. | හිඟ ශේෂ අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මුදුන කඩේ ජල ව්‍යාපෘතිය 2012 වර්ෂයේ ජල සම්පාදන මණ්ඩලයට පවරා දී ඇතත් රු.822,572 ක හිඟ ජල ගාස්තු අයකර ගැනීමට හෝ පවරා දීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව. | හිඟ ශේෂ අයකළ යුතුය. |
| (ඉ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,951,360 හා මුද්දර ගාස්තු රු.119,529,130 ක් විය. | අයවැය අධ්‍යක්ෂ වෙත ලිපි යොමු කර ඇති බව. | මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී සභාබල ප්‍රාදේශයේ ග්‍රාම නිලධාරී වසම් 09 ක් ආවරණය වන සේ රු. මිලියන 70.39 ක ඇස්තමේන්තුවක් මත වැඩ ආරම්භ කළ අංකෙලිපිටිය මොරගොල්ල ජල ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 51.16 ක් වැය කර 2018 වර්ෂයේ සිට අතරමග නවතා දමා තිබුණි. නිමකල වටිනාකමින් රු.මිලියන 19.2 ක් තවදුරටත් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට තිබුණි. සභා බල ප්‍රදේශයේ උග්‍ර පානීය ජල හිඟයක් පවතින අතර මහ ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට පත්ව තිබුණි. එසේ වුවද අදාල ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණු අතර දැනට වැය කර තිබූ රු. මිලියන 51.16 නිෂ්කාර්ය වී තිබුණි. මෙම ව්‍යාපාතිය සඳහා කොන්ත්‍රාත්කරු විසින් මිලදී ගෙන තිබුණු රු.3,582,000 ක් වටිනා ජල මෝටර් 4 ක් හා රු.2,587,000 ක් වටිනා විදුලි සැපයුම් යනාදිය නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව. | අදාළ මුදල් ලබාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් ජල ව්‍යාපෘති 02 ක සිදුකර තිබුණු ජල සාම්පල් පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඊ කෝලි (E Coli) බැක්ටීරියා සාන්ද්‍රනය 2 - 16 දක්වා පරාසයක පැවති අතර කොලිෆෝම් (Coliform) බැක්ටීරියාව 38 - 64 අතර පැවතිණි. ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා බීමට නුසුදුසු අපවිත්‍ර ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | නැවත පරීක්ෂා කිරීමට කටයුතු කරන බව | පිරිසිදු ජලය බෙදා හැරිය යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 (ආ) වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලී රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවකින් වැළඳගෙන නොමැති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.5,808,200 ක කර්මාන්ත ණයහිමි ශේෂයන් පැවති අතර, ඉන් වසර 1 ත් 3 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.1,500,000 ක් විය. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යොමු කර ඇති බව | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාබල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති 08 කට අදාළ ජල පාරිභෝගිකයින් 3600 ක් පමණ සිටියද ඉන් පාරිභෝකියින් 511 කට පමණක් ජල මනු සවිකර තිබුණු අතර නිවැරදි ජල ගාස්තු අයවීමක් සිදුව නොතිබුණි. | ඉදිරිවර්ෂයේ කටයුතු කරන බව. | ජල මනු සවිකර ගාස්තු අයකළ යුතුය. |
| (ඇ) | 2009 හා 2020 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 21,990,425 ක් හා 2008 වර්ෂයට අදාළ රු. 130,337 ක උසාවි දඩ සම්බන්ධයෙන් විමසීම් කර නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උප ලේඛන ඉදිරිපත් කරන ලෙස අදාළ පාර්ශව දැනුවත් කර ඇති බව. | ආදායම් ලබා ගැනීමට හෝ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ පැවති රු. 7,529,934 ක මුදල අධිකාරිය විමසා ප්‍රාදේශීය | ඉදිරියේදී සංවර්ධන කටයුතු සඳහා යොදා ගන්නා බව. | සංවර්ධන කටයුතු සඳහා යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන කටයුතු සඳහා යොදවා ගෙන නොතිබුණි. | | |
| (ඉ) | තලාතුඔය නගරයේ අංක 03 කඩ කාමරය පිහිටි ඉඩමේ නීත්‍යානුකූල භාවය තහවුරු කර ගෙන නොතිබුණි | අයිතිය රජය සතු අතර බදු කුලිය වැඩි කළ විට මුදල් නොගෙවූ බව. | සභාවට ඇති නිත්‍යානුකූල අයිතිය තහවුරු කරගත යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළඳ, වානිජ හා සංචාරක දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන රු.4,812,538 ක් සහ සභා අරමුදලේ රු.1,258,000 ක් වශයෙන් රු. 6,070,538 ක් වියදම් කර ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් භූමියක ඉදිකර තිබූ ලූල්කඳුර සංචාරක මධ්‍යස්ථානය හා එහි ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ආයතනය දැනුවත් කරන බව. | අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) | සභාව පරිහරණය කරන රු. 19,652,781ක ඉඩම් 28 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී පවරාගැනීමට කටයුතු කරන බව | අයිතිය පවරා ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 11 ක පුරප්පාඩු 25 ක් ද තනතුරු 01 ක අතිරික්තතා 11 ක් ද පැවතුණි. | පුරප්පාඩු සම්බන්ධව දැනුවත් කර ඇති අතර අතිරික්තය සංවර්ධන නිලධාරීන් බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| **(ආ)** | 2014 සිට සමාලෝචිත වර්ෂයට අදාළව ස්ථාන මාරුවී ගිය, මිය ගිය නිලධාරියකුගේ හා කම්කරුවන් තිදෙනෙකුගේ එකතුව රු.231,665 ක ණය ශේෂයක් අයකර නොතිබුණි. | ඉදිරියේදී අයකරගැනීමට කටයුතු කරන බව | ණය අයකර ගත යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**තිරසර සංවධර්න අරමුණු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ව්‍යාපෘති ඉටු කළ බව. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |